**සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම - 2017**

**-----------------------------------------------------------------**

**සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනමේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 19 දරන සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම පනතේ 11(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

## 1.3 විගණකගේ වගකීම

**------------------------**

**මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.**

**මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මත සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස පදනමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.**

**මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේදවල දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

---

2.1 තත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 හා 2.3 ඡේද වල දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 කරුණු අවධාරණය කිරීම

---

2016 ජුලි 20 දිනැති සිඑස්ජ්/1/31 දරන ජනාධිපති ලේකම්වරයාගේ ලිපියෙහි සඳහන් පරිදි 2016 ජුනි 21 දිනැති අපම/16/1095/739/004 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වහාම ක්‍රියාත්මක වන පරිදි සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනමේ ස්ථිර කාර්ය මණ්ඩලය ඇතුළුව පදනම යටතේ පවතින ව්‍යාපෘති 04 ද එහි චංචල හා නිශ්චල දේපල ද කාර්යභාරයන් ද අදාල රේඛීය අමාත්‍යාංශය වූ කඳුරට නව ගම්මාන හා වතු යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයට පවරා ගැනිමට තීරණය කර තිබුණි. ඒ අනුව 2017 ජනවාරි 01 දින සිට පදනමේ සියළුම වියදම් අදාල රේඛීය අමාත්‍යාංශය මඟින් සිදු වන බැවින් පදනමේ සියළුම ජංගම ගිණුම්වල ගනුදෙනු නවතා තිබුණි. එමෙන්ම පදනම සඳහා 2015 වර්ෂයේ සිට අධ්‍යක්ෂ මණ්ඩලයක් ද පත් කර නොතිබුණි. ඒ හේතුන් නිසා පදනමේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත විය.

2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

2.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7

---

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 47 ඡේදය ප්‍රකාරව දේපල පිරියත හා උපකරණ සෑම වර්ෂ තුනකට හෝ පහකට වරක් ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානයට තිබුණු පිරිවැය රු. 625,643,071 ක් වූ දේපල පිරියත හා උපකරණ සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. කෙසේවෙතත් ඉහත සඳහන් පරිදි පදනමේ චංචල හා නිශ්චල දේපල අදාල අමාත්‍යාංශයට පවරා දිය යුතු වුවත් එසේ නොකර තව දුරටත් පදනමේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

2.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති
--------------------------

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන රු. 360,962,513 ක් වූ රජයේ ප්‍රදාන යොදා ගනිමින් මිලදීගත් ස්ථාවර වත්කම් වාර්ෂිකව ක්ෂය කරන නමුත් එම ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කිරීමේ ප්‍රතිපත්තියක් පදනම විසින් හඳුනාගෙන ක්‍රමක්ෂය කර නොතිබුණි.

2.3.3 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට පදනමේ ව්‍යාපෘති හතරෙහි හා ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ගෙවීම රේඛීය අමාත්‍යාංශය මඟින් සිදු කරන බැවින් පදනමේ ප්‍රධාන කාර්යාලය හා අනෙකුත් ව්‍යාපෘතිවලින් ගෙවන ලද රු. 1,415,800 ක් වූ උත්සව අත්තිකාරම් හා රු. 122,396 ක් වූ කාර්ය මණ්ඩල ණය අමාත්‍යාංශය විසින් කාර්ය මණ්ඩල වැටුප්වලින් අඩුකර ගෙන තිබුණද පදනමේ මූල්‍ය ප්‍රකාශනවල අදාළ ගැලපීම් සිදු කර නොතිබුණි.

(ආ) ප්‍රජාශක්ති මධ්‍යස්ථානවල 2009 දෙසැම්බර් 16 දින සිට 2013 නොවැම්බර් 01 දින දක්වා කරන ලද V-SAT ඇන්ටනා නඩත්තු සේවා අවස්ථා 120 කින් 96 ක් සඳහා අන්තර්ජාල සේවා සමාගමක් වෙත ගෙවිය යුතු රු.5,415,000 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි. මීට අදාලව 2018 නොවැම්බර් 28 දිනැති පදනමේ අධ්‍යක්ෂක (මුදල්) විසින් විගණනය වෙත ලබාදෙන ලද පිලිතුර අනුව රේඛීය අමාත්‍යාංශය මෙම මුදල් ගෙවීම අත්හිටුවා ඇති බැවින් මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් නොකළ බව දක්වා තිබුණි.

2.4 ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්
-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලංකා කම්කරු කොංග්‍රසය පවත්වාගෙන යන ගොඩනැගිල්ලේ වැඩිදියුණු කටයුතු සඳහා පදනම විසින් වැයකර තිබූ රු.3,092,687 ක් වූ මුදල 2012 දෙසැම්බර් සිට රු.51,545 ක් බැගින් වූ මාසික වාරික 60 කින් අයකර ගැනීමට දෙපාර්ශවය එකඟතාවයට පැමිණ පැවතියද, සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රු. 2,457,239 ක ලැබිය යුතු මුදලක් පැවතිණි.

(ආ) ප්‍රජාශක්ති සංවර්ධන ව්‍යාපෘතියේ කටයුතු අධීක්ෂණය කිරීමට පරිගණක දත්ත පද්ධතියක් ඇති කිරීම සඳහා පෞද්ගලික ආයතනයකට 2014 අප්‍රේල් 23 දින ලබා දී තිබූ රු.541,840 ක අත්තිකාරම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කර නොතිබුණි.

(ඇ) වසර 4 කට වැඩි දීර්ඝ කාලයක සිට ගිණුම් වලින් ඉදිරියට ගෙන එමින් තිබූ රු.13,698,356 ක අත්තිකාරම් හා ණයගැති ශේෂ 08 ක් හා රු. 16,731,700 ක ණයහිමි හා ගෙවිය යුතු ශේෂ 37 ක් අයකර ගැනිමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශන වල අතැති මුදල් යටතේ දක්වා තිබූ ප්‍රජාශක්ති ව්‍යාපෘතිය සඳහා ලබා දුන් රු. 96,780 ක් ද නෝවුඩ්හි තොණ්ඩමන් ක්‍රීඩා සංකීර්ණය සඳහා ලබා දුන් රු. 80,900 ක් ද වශයෙන් එකතුව රු. 177,680 ක් වූ අත්තිකාරම් විගණන අවස්ථාව වූ 2018 සැප්තැම්බර් 30 දින වන විටත් නැවත අය කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 හා ඊට පෙර වර්ෂ වලට අදාලව එවකට පැවැති රේඛීය අමාත්‍යාංශයෙන් රු. 63,446,471 ක මුදලක් පදනම වෙත ප්‍රතිපූරණය කළ යුතු ලෙස දක්වා තිබුණ ද එවැනි මුදලක් පදනමට ප්‍රතිපූරණය කළ යුතු ලෙසට අදාල රේඛීය අමාත්‍යාංශයේ ගිණුම් වලින් හෙළිදරව් නොකෙරිණි.

(ඊ) මිලදී ගත් දින සිට මාසයක් ඇතුලත මුදල් පියවීමේ පදනම මත 2014 වර්ෂය තුළ දී රු.72,726,994 කට සිමෙන්ති බ්ලොක්ගල් මැෂින්, ක්‍රීඩා හා පූජා භාණ්ඩ, පරිගණක හා විවිධ උපකරණ රජයේ සමාගමකින් මිලදී ගෙන තිබුණි. කෙසේ වෙතත් 2017 වර්ෂය අවසාන වන විටත් පදනම විසින් අදාල සමාගමට එකී මුදල් ගෙවා නොතිබුණි. අදාල සමාගමේ 2015 අප්‍රේල් 6 දිනැති ලිපියට අනුව මෙම අගය රු.73,709,130 ක් ලෙස දක්වා තිබුණි.

## 2.5 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත පරිදි නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීතිරීති , රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 371 (2) වගන්තිය | දෙන ලද අතුරු අග්‍රිමයක් එය දෙන ලද කාර්යය නිම කළ වහාම පියවිය යුතු වුවත් පදනමේ නිලධාරියෙකු වෙත ලබා දී තිබූ 2014 වර්ෂයට පෙර සිට පැවත එන රු. 523,000 ක අත්තිකාරම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පියවා නොතිබුණි. |
| (ආ) | 2002 නොවැම්බර් 28 හා අංක අයිඑ්අයි /2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක, උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) | 2005 අංක 19 දරන සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනමේ පනතේ 10 (4) වගන්තිය | පදනම විසින් ස්වකීය බලතල හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේ දි යම් වියදමක් දැරීම සඳහා අවශ්‍ය වන සියලුම මුදල් ප්‍රමාණ අරමුදල ඉපයූ ආදායමින් දැරිය යුතු වුවත් එම වගන්ති සංශෝධනය කිරීමකින් තොරව 2016 වර්ෂය දක්වා වූ වියදම් සඳහා අවශ්‍ය වන අරමුදල් අමාත්‍යාංශයෙන් ලබා ගෙන තිබුණි. |
| (ඈ) | 1981 අංක 26 දරන සේවක අර්ථසාධක අරමුදල් සංශෝධිත පනතේ 11 ඡේදයේ 10(1) හා (2) ඡේද | 2012 වර්ෂයේ සිට 2013 වසර දක්වා කාලය සඳහා අර්ථසාධක අරමුදල වෙත ප්‍රේෂණය කල යුතු රු.4,205,283 ක් වූ සේවක හා සේවා දායකය සේවක අර්ථසාධක අරමුදල වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |

3 . මූල්‍ය සමාලෝචනය
-----------------------

3.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ පදනමේ මූල්‍ය ප්‍රතිඵලය රු. 29,644,908 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.32,380,913 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,736,005 ක වර්ධනයක් විය. සමාලෝචිත වර්ෂය තුළ මෙහෙයුම් කටයුතු සිදු නොකිරීම හේතුවෙන් වියදම රු. 101,837,042 ක් හා රජයේ ප්‍රදාන රු. 96,593,718 ක් අඩුවීම මෙම වර්ධනයට ප්‍රධාන ලෙස හේතු වී තිබුණි.

4 මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

4.1 කාර්යසාධනය
----------------

4.1.1 සැලසුම් කිරිම
----------------

සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.2 අනාර්ථික ගනුදෙනු
------------------------

පහත සඳහන් නිරික්ෂණ කරනු ලැබේ.

(අ) රම්බොඩ සංස්කෘතික මධ්‍යස්ථානයේ ප්‍රයෝජනය සඳහා රු. 1,000,000 ක මූලික ගෙවීමක් සහ මාසික වාරික 60 කින් ගෙවීමේ පදනම මත රු.5,840,000 කට පෞද්ගලික සමාගමකින් 2014 නොවැම්බර් 25 දින කල්බදු ක්‍රමයට මිට්යුබිෂි ඩබල් කැබ් රථයක් මිලදී ගෙන තිබුණි. මේ සඳහා 2010 දෙසැම්බර් 07 දිනැති අයවැය චක්‍රලේඛ 150 හි විධිවිධාන පරිදි රේඛීය අමාත්‍යාංශයේ හා භාණ්ඩාගාරයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගැනිමට කටයුතු කර නොතිබුණි. නිසි පරිදි වාරික නොගෙවිම මත 2015 නොවැම්බර් වන විට වාහනය කල්බදු සමාගම වෙත පවරා ගෙන තිබීම හේතුවෙන් ඒ සඳහා ගෙවීම් කර තිබූ රු. 1,565,000 ක් වූ මුදල අනාර්ථික ගනුදෙනුවක් බවට පත්ව තිබුණි.

(ආ) 2013 වර්ෂයේ දි පදනම විසින් රු. 150,000 ක වියදමක් දරා බාහිර උපදේශකවරයකු වෙතින් සකස් කරවා ගත් බඳවා ගැනිමේ පරිපාටිය 2017 වර්ෂය අවසානය වන විටත් අනුමත කරවා ගෙන නොතිබුණි. කෙසේවෙතත් පදනමේ කාර්ය මණ්ඩලය අමාත්‍යාංශය යටතට පවරා ගැනීම හේතුවෙන් මෙම වියදම අනාර්ථික වියදමක් බවට පත්ව තිබුණි.

**4 . 3** කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2005 අංක 19 දරන පදනම පිහිට වූ පනතේ 10(2) වගන්තිය යටතේ පදනමට පවරාදී තිබුණු ඉඩම් හා ගොඩනැගිලි සඳහා ඔප්පු පිළියෙල කිරීම 2017 දෙසැම්බර් 31 දින වන විටත් සිදුකර නොතිබුණි.

(ආ) පදනම විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රජාශක්ති මධ්‍යස්ථාන 44 ක අයිතිය පදනම වෙතට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර තවත් ප්‍රජාශක්ති මධ්‍යස්ථාන 35 ක් ඉදිකිරීමට 2012 වර්ෂයේ දී ඉඩම් මැනුම් කටයුතු සිදුකිරීම සඳහා රු. 2,359,298 ක් වැය කර තිබුණද, එකී ඉඩම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පදනමට පවරා ගෙන නොතිබුණි.

(ඇ) 2010 වර්ෂයේ සිට 2013 වර්ෂයේ අප්‍රේල් දක්වා කාලපරිච්ඡේදය සඳහා ප්‍රජාශක්ති ව්‍යාපෘතිය යටතේ තෝරාගත් ප්‍රදේශ කිහිපයක ක්ෂේත්‍ර සම්බන්ධීකරණ කටයුතු සඳහා රේඛිය අමාත්‍යාංශය විසින් පදනම වෙත ලබා දී තිබුණු රු.20,484,000 ක මුදලක් පත්වීම් ලිපියක් හෝ නිශ්චිත කාර්ය පැවරුමක් නොමැති 90 දෙනෙකු වෙත සත්‍ය වශයෙන් ඉටුකළ රාජකාරි කටයුතු පිළිබඳ තහවුරු කිරීමකින් තොරව ගෙවා තිබුණි.

**4.4** දූශ්‍ය අක්‍රමිකතා

ක්ෂේත්‍ර සම්බන්ධීකරණ කටයුතු සම්බන්ධයෙන් පැවති දුර්වල කළමනාකරණය හේතුවෙන් පදනමේ ව්‍යාපෘති කළමණාකරු හා ව්‍යාපෘති සම්බන්ධීකාරක විසින් 2011 අප්‍රේල් සිට 2013 අප්‍රේල් දක්වා කාලපරිච්ඡේදය තුල ව්‍යාජ නම් ඉදිරිපත් කර ක්ෂේත්‍ර සම්බන්ධීකරණ දීමනා ව්‍යාපෘති කළමණාකරුවන්ගේ පෞද්ගලික බැංකු ගිණුම්වලට වංචා සහගතව බැරකර ගෙන තිබුණි. ඒ පිළිබඳ සිදුකරන ලද විමර්ෂණයකින් පසුව මෙලෙස බැර කර ගෙන තිබූ රු.4,252,500 ක් එම නිලධාරින් ආපසු ගෙවීමට එකඟ වී 2013 මැයි 31 දින වනවිට රු.1,050,000 ක් අයකර ගෙන තිබූ අතර ඉතිරි මුදල වූ රු. 3,202,500 ක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් අමාත්‍යාංශය වෙත එහි මුදල් ප්‍රතිපාදනය කිරීමටද නොහැකි වී තිබුණි. මීට අදාලව 2018 නොවැම්බර් 28 දිනැති පදනමේ අධ්‍යක්ෂ (මුදල්) විසින් විගණනය වෙත ලබා දෙන ලද පිළිතුර අනුව මෙම මුදල් අයකර ගැනීම සඳහා නඩු පවරා ඇතිබව දක්වා ඇත.

**4.5** ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

**4.5.1** ප්‍රමාද වූ ව්‍යාපෘති

ගිවිසුම්ගත පිරිවැය රු.72,818,294 ක් වූ 2010 සිට 2012 කාලය තුල ගිවිසුම්ගතව තිබූ තොණ්ඩමන් සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු රු.25,675,995 ක කළවැඩ වටිනාකමක් දැරීමෙන් අනතුරුව සමාලෝචිත වර්ෂය වනවිට නතර කර තිබුණි. මීට අමතරව මෙම ව්‍යාපෘතියට අදාලව මූලා ප්‍රකාශන වල නොපිය වූ අත්තිකාරම් ලෙස රු.7,544.265 ක් හා කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු ලෙස රු.1,985,942 ක් ද දක්වා තිබුණි.

## 4.6 නිශ්ක්‍රීය හෝ ඌනඋපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන තුළ ජංගම වත්කම් ලෙස සඳහන් කර තිබුණු රු.398,989 ක් වටිනා සමරු ඵලක තොගය දීර්ඝ කාලයක සිට බෙදා හැරීමට කටයුතු නොකර නිෂ්කාර්යව පැවති බව නිරීක්ෂණය විය.

(ආ) ස්වයං රැකියා ණය ව්‍යාපෘතිය යටතේ (Self-Employment Loan Project) ප්‍රජාශක්ති මධ්‍යස්ථානවලට ලබා දීම සඳහා 2014 දෙසැම්බර් 01 දින රු. 4,048,000 කට මිලදී ගෙන තිබුණු සිමෙන්ති බ්ලොක් ගල් මැෂින් 44 න් විගණිත දිනයවූ 2018 සැප්තැම්බර් 05 දින වන විට බ්ලොක් ගල් මැෂින් 10 ක් පමණක් ප්‍රජාශක්ති මධ්‍යස්ථානවලට හා ස්වයං රැකියාලාභීන් වෙත ලබා දී තිබුණි. ඒ අනුව රු.3,128,000 ක් වටිනා බ්ලොක් ගල් මැෂින් 34 ක් නිශ්කාර්යව පැවතුණි.

(ඇ) පරිත්‍යාග වශයෙන් බෙදා හැරීම සඳහා 2014 වර්ෂයේ දී රු. 2,794,368 කට මිළදි ගෙන තිබූ කෝවිල් සීනු 15 න් 08 ක් ද, පිත්තල පූජා පහන් කට්ටල 377 න් 309 ක් ද, ක්‍රීඩා උපකරණ කට්ටල 194 න් කොටසක් ද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිශ්කාර්යව තොණ්ඩමන් ක්‍රීඩා සංකීර්ණයේ ගබඩා කර තිබුණි.

(ඈ) පදනමට අදාල සියළුම වියදම් අමාත්‍යාංශය මඟින් සිදු කරන බැවින් පදනමෙහි ප්‍රධාන කාර්යාලයේ හා ව්‍යාපෘතිවල පවත්වා ගෙන යනු ලැබූ බැංකු ජංගම ගිණුම් වල රු.915,415 ක් 2017 වර්ෂයේ පෙබරවාරි සිට විගණන දිනය වූ 2018 සැප්තැම්බර් දක්වා නිශ්කාර්යව පැවැතුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය ඉකුත් වී දින 60 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් පදනම විසින් 2017 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2018 සැප්තැම්බර් 25 දින ඉදිරිපත් කර තිබුණි.

## 5.2 වාර්ෂික වාර්තා පාර්ලිමේන්තු සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛනයේ 6.5.3 ඡේදය ප්‍රකාරව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු වුවත් පදනම ආරම්භ කළ 2005 වර්ෂයේ සිට වාර්ෂික වාර්තා සභාගත කිරීමක් සිදුකර නොතිබුණි.